# ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ දෙමළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඝාතනය කෙරෙයි

## High-profile Tamil parliamentarian murdered in Sri Lanka

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2006 නොවැම්බර් 15**

පසු ගිය සිකුරාදා දෙමළ මන්ත්‍රී නඩරාජා රවිරාජ් ඝාතනය, ආන්ඩුව රට යලිත් සිවිල් යුද්ධය තුලට තල්ලු කර දැමීමත් සමග මේ වසරේ වර්ධනය වූ ඝාතන, "අතුරුදහන් වීම්" හා පැහැර ගෙන යාම් සහිත දීර්ඝ සිදුවීම් ලැයිස්තුවේ මෑතම සිද්ධිය යි. අපරාධකරුවන් කිසිවෙක් අල්ලා ගෙන නීතිමය ක්‍රියාමාර්ග ගෙන නැති නමුත් සාක්ෂ්‍ය මගින් ඇඟිල්ල දිගු කෙරෙන්නේ මිලිටරිය, එය හා අනුබද්ධිත පැරා-මිලිටරි කන්ඩායම් සහ සෙසු ඝාතන කල්ලි වෙත ය.

ඔහු යුද්ධයට හා පැහැර ගෙන යාම්වලට එරෙහි ප්‍රසිද්ධ උද්ඝෝෂනවලට සහභාගි වී ඇති බැවින් රවිරාජ් ඝාතනය විශේෂයෙන් ම ප්‍රකෝපකාරී ක්‍රියාවකි. ඔහුගේ ඝාතනයට විරෝධය දක්වනු වස් සඳුදා කොලඹ නගර මධ්‍යයේ දහස් ගනන් ජනයා පෙලපාලි දැක්වූහ. "මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ නතර කරනු" සහ "ලැජ්ජයි" යන පාඨ සහිත බැනර් ප්‍රදර්ශනය කරමින් සහ "දෙමළ ජනයා මරන්න එපා" යැයි හඬ නගමින්, ජනයා ඝාතනය ලක් වූ මන්ත්‍රීවරයාගේ දේහය ද රැගෙන නගරයේ වීදි දිගේ පෙලපාලි ගියහ.

කොලඹ නාරාහේන්පිට ඔහුගේ නිවසින් පිටත් වීමෙන් පසුව රවිරාජ් මහ දවාලේ වෙඩි තබා මරා දමන ලදි. උදේ 8.30ට පමන, ඔහුගේ වාහනය ප්‍රධාන මහා මාර්ගයට හැරවීමට යන විට තුවක්කුකරුවෙක් වාහනයට උන්ඩ වරුසාවක් එල්ල කලේ ය. මන්ත්‍රීවරයා සහ ඔහුගේ පොලිස් ආරක්ෂකයා ඝාතනය කෙරුනි. ඝාතකයා තමා බලාපොරොත්තුවෙන් සිටි යතුරු පැදියකින් පලා ගිය අතර පොලීසිය පසුව හිස් උන්ඩ කොපු සහිත බෑගයක තිබූ ටී 56 ස්වයංක්‍රීය ගිනි අවියක් හා හෙල්මටයක් සොයා ගත්තේ ය.

අපරාධය සිදු වූ ස්ථානයට ලඟා වීමේ දී හා ඉන් පිටවීමේ දී මාර්ග බාධක හා මුර කපොලු මග හැරීමට තුවක්කුකරුවා සමත් වීම, ආරක්ෂක හමුදාවන්ගේ සම්බන්ධය පිලිබඳ සැකයක් මතු කරයි. ඝාතනය සිදු වූයේ මිලිටරි පොලිස් මූලස්ථානයට සමීපව සහ ප්‍රධාන මිලිටරි කඳවුරකට ද නාරාහේන්පිට හා බොරැල්ලේ පිහිටි පොලිස් ස්ථාන දෙකකට ද කිලෝමීටරයක් දුරින් උදැසන බෙහෙවින් මාර්ග තදබදය පවතින අවස්ථාවක ය.

නීතිඥයකු වූ රවිරාජ්, දෙමළ ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ හොරනෑවක් ලෙස ක්‍රියා කරන දෙමළ පක්ෂවලින් සෑදි කන්ඩායමක් වන දෙමළ ජාතික සන්ධානයේ (ටීඑන්ඒ) ප්‍රමුඛ පාර්ලිමේන්තු සභිකයෙක් විය. ඔහුගේ අවමඟුල ඔහුගේ උපන් ගම වන උතුරේ යාපන අර්ධද්වීපයේ චාවාකච්චේරි නගරයේ දී සිදු කෙරෙනු ඇත. සිවිල් යුද්ධය උත්සන්න කිරීම ගැන ජනාධිපති මහින්ද රාජපක්ෂට හා ඔහුගේ ආන්ඩුවට දොස් නගා ඇති ටීඑන්ඒ යුද්ධය අවසන් කිරීමට බලය බෙදා ගැනීමේ සාකච්ඡාමය සම්මුතියක් සඳහා උද්ඝෝෂනය කලේ ය.

රවිරාජ් "නාඳුනන" තුවක්කුකරුවන් විසින් මරා දැමුනු දෙවන ටීඑන්ඒ මන්ත්‍රීවරයා ය. පසු ගිය දෙසැම්බරයේ දී මඩකලපු දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් පරරාජසිංහම් අමු අමුවේ මරා දැමීම, 2002 සටන් විරාමයට වල කැපීමෙහි ලා සහ ආරක්ෂක හමුදාවන් හා එල්ටීටීඊය අතර තිරයෙන් පිටුපස සිට කෙරෙන අවෘත යුද්ධයක් අවුලුවාලීමෙහි ලා සැලකිය යුතු ක්‍රියාකලාපයක් ඉටු කලේ ය. ඔහුගේ පුරප්පාඩුවට පත් කිරීමට සැලසුම් කර තිබූ වී. විග්නේස්වරන් අප්‍රේල් 7 දා ඝාතනය කිරීම, පෙබරවාරියේ ජිනීවාහි පැවති පලමු සාකච්ඡා වටයට පසුව තව දුර සාම කතා සඳහා තිබූ බලාපොරොත්තු විනාශ කලේ ය.

රවිරාජ් ඝාතනය කිරීමට පෙර දින, ඔහු සහ සෙසු ටීඑන්ඒ මන්ත්‍රීවරු මිලිටරිය දෙමළ සිවිල් වැසියන් මරා දැමීමට ද පැහැර ගෙන යාම් හා අධිකරන ක්‍රියා මාර්ගයන්ට පරිබාහිරව කෙරෙන ඝාතන විශාල වසයෙන් ඉහල යාමට ද විරෝධය පල කරනු වස් කොලඹ එක්සත් ජාතීන්ගේ කාර්යාලය ඉදිරිපිට උද්ඝෝෂනයක නිරත වූහ. දිවයිනේ නැගෙනහිර පලාතේ කදිරවේලිහි දී සරනගත කඳවුරකට එල්ල කෙරුනු හමුදා රොකට් හා කාල තුවක්කු ප්‍රහාරයකින් පසු ගිය සතියේ සිවිල් වැසියන් 40කට වැඩි පිරිසක් ඝාතනය වීමේ සිද්ධිය එහි දී අවධාරනය කෙරුනි.

ටීඑන්ඒ හා එල්ටීටීඊ යන දෙගොල්ල ම ඝාතනය සම්බන්ධයෙන් ආරක්ෂක හමුදාවන්ට දොස් පවරා තිබේ. ටීඑන්ඒ නායක ආර්. සම්බන්ධන් මාධ්‍යවලට මෙසේ පැවසී යඃ "රවිරාජ් ඝාතනය වනාහි දෙමල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හඬ මැඩීමට ශ්‍රී ලංකා හමුදාව සමග ක්‍රියාත්මක වන පැරා-මිලිටරි කන්ඩායම් විසින් දරන ලද පැහැදිලි ප්‍රයත්නයකි."

එල්ටීටීඊය හා එහි ආධාරකරුවන්ට ප්‍රහාර එල්ල කිරීමේ දී එල්ටීටීඊ විරෝධී විවිධ සන්නද්ධ කන්ඩායම් සමග සහයෝගීව ක්‍රියා කිරීම පිලිබඳ දීර්ඝ ඉතිහාසයක් මිලිටරි ඔත්තු සේවාවන්ට ඇත. කරුනා කන්ඩායම නමින් ප්‍රසිද්ධ එල්ටීටීඊයෙන් බිඳී ගිය කන්ඩායමක් සහ රාජපක්ෂ ආන්ඩුවේ සභාග හවුල්කරුවකු වන ඊලම් මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (ඊපීඩීපී) හමුදාව සමග සහයෝගී වන පැරා-මිලිටරි කන්ඩායම්වලට ඇතුලත් වේ.

"රට හා ආන්ඩුව අපකීර්තියට පත් කරනු පිනිස හිතාමතා හා හොඳින් සැලසුම් කොට සිදු කල . . . තිරශ්චීන ක්‍රියාවක්" ලෙස ඝාතනය විස්තර කරමින් දෝෂාරෝපනය අපසරනය කිරීමේ වැයමක ජනාධිපති රාජපක්ෂ යෙදුනේ ය. ආන්ඩුවේ කීර්තිය පලුදු කරනු වස් එල්ටීටීඊය තමන්ගේ ම අයකු ඝාතනය කර ඇති බවට ඇඟවුම් කරන අංශු මාත්‍රයක හෝ සාක්ෂ්‍යයක් ඔහු ඉදිරිපත් කලේ නැත. මෙය වනාහි ආරක්ෂක හමුදාවන්ට සම්බන්ධ ම්ලේච්ඡ ක්‍රියාවන් හමුවේ මිලිටරිය, ආන්ඩුව හා කොලඹ මාධ්‍ය විසින් තොරොම්බල් කෙරෙන සම්මත ක්ෂමාලාපයකි.

ඝාතනය පිලිබඳ පරීක්ෂන පැවැත්වීමේ දී බ්‍රිතාන්‍යයේ ස්කොට්ලන්ඩ් යාඩ් රහස් පොලීසියේ සහයෝගය ලබා ගන්නා ලෙස ද රාජපක්ෂ විදේශ අමාත්‍යාංශයට උපදෙස් දී ඇත. මෙම පියවර ශ්‍රී ලංකාවේ මිලිටරියේ ක්‍රියාවන්ට එල්ල වන වැඩෙන දේශීය හා ජාත්‍යන්තර විවේචන අපසරනය කිරීමේ එල්ලය සහිත හිස් මවා පෑමකි.

එල්ටීටීඊයට එරෙහිව ආක්‍රමනික මෙහෙයුම් ඉදිරියට ගෙන යන ලෙස මිලිටරියට අන දෙන අතර ම, මහ බලවතුන්ගේ සහයෝගය පවත්වා ගෙන යාමත් රට තුල යුද විරෝධී මනෝගතියට මුහුන දීමත් පිනිස" සාම දූතයකුගේ" වෙස් පෑම ගෙන යාමට රාජපක්ෂ තවමත් වෙර දරයි.

ඝාතනය සම්බන්ධයෙන් පොලීසිය පුද්ගලයන් අට දෙනෙකු රඳවා ගෙන ප්‍රශ්න කිරීමේ යෙදී සිටී. කෙසේ වෙතත්, ඝාතකයා හෝ ඔහුගේ සමීපතම උදව්කරුවන් ඔවුන් අතර සිටීමට ඇති ඉඩ කඩ බෙහෙවින් අඩු ය. සෑම නව ඝාතනයක් සමග ම ආන්ඩුව වතාවතක් ලෙස පරීක්ෂනයක් පැවැත්වෙන බව නිවේදනය කරයි. කෙසේ වෙතත්, ආරක්ෂක හමුදාවන්ට චෝදනා එල්ල වූ සිද්ධිවල දී, පොලීසිය පසු ගිය වසර මුලුල්ලේ ම කිසිවෙකුට විරුද්ධව නඩු පවරා නැත.

යුද්ධයට එරෙහිව නැගෙන මහජන විරුද්ධත්වය ගැන නොසන්සුන්ව, ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය යන දෙගොල්ල ම ඝාතනය හෙලා දැක තිබේ. මෙම සිංහල අන්තවාදී පක්ෂ දෙක එල්ටීටීඊයට විරුද්ධ යුද්ධය උත්සන්න කරන ලෙස උද්ඝෝෂනය කර ඇති අතර මිලිටරියේ අපරාධ සියල්ලට ම පිටුබලය ද සපයා ඇත. දෙගොල්ල ම විවිධ පැරා-මිලිටරි සංවිධාන සමග, විශේෂයෙන් ම කරුනා කන්ඩායම සමග, සමීපව සහයෝගී වී ඇති අතර අතීතයේ දී ඔවුන් ම ප්‍රචන්ඩ ප්‍රකෝපකාරී ක්‍රියාවන්හි යෙදී තිබේ.

රවිරාජ් ඝාතනය, එල්ටීටීඊයට විරුද්ධ සිය මෙහෙයුම් තව දුරටත් උත්සන්න කිරීමට මිලිටරිය සූදානම් වන බවට ලකුනකි. එමෙන් ම එය යුද්ධයට විරුද්ධ වන ඕනෑම අයෙකුට එරෙහිව යොදා ගනු ලැබෙන විධි ක්‍රම පිලිබඳ තියුනු අනතුරු ඇඟවීමකි.

© www.wsws.org